# හින්දී විභක්ති ප්‍රත්‍ය භාවිතයේ දී සිංහල භාෂික විද්‍යාර්ථීන්ට මුහුණපෑමට සිදුවන ගැටලු

නීතා සුභාෂිණී සෙනෙවිරත්න
හින්දී අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය

---

## ABSTRACT

විවිධ අර්ථ දනවන පරිදි වාක්‍ය නිර්මාණය කිරීමෙහි ලා ඉතා වැදගත් වන්නා වූ ව්‍යාකරණ ඒකකයක් ලෙස විභක්ති ප්‍රත්‍ය හැඳින්විය හැකි ය. හින්දී භාෂාව පිළිබඳ අවධානය යොමු කිරීමේ දී විභක්ති ප්‍රත්‍ය යනුවෙන් අදහස් කරනුයේ කර්තෘ, කර්ම, කරණ, සම්ප්‍රදාන, සම්බන්ධ, අධිකරණ ආදි වූ විවිධ කාරක ප්‍රභේද දැක්වීම සඳහා නාමපදයක් හෝ සර්වනාමයක් ඉදිරියෙන් යොදනු ලබන ප්‍රත්‍යයි. හින්දී භාෂාවේ විභක්ති ප්‍රත්‍ය මූලික වශයෙන් ප්‍රභේද අටකි. එනම් 'නේ ', 'කෝ ', 'සේ ', 'කා', 'කේ ', 'කී', 'මේ°', 'පර්' යනුවෙනි.

සිංහල භාෂාව හා සැසඳීමේ දී හින්දී  භාෂාවේ විභක්ති ප්‍රත්‍ය භාවිතය විශේෂ ලක්ෂණයන්ගෙන් සමන්විත වේ. ඉන් අතුරින් හින්දී ලේඛනයේ දී විභක්ති ප්‍රත්‍ය භාවිතය 'විශ්ලිෂ්ට' සහ 'සංශ්ලිෂ්ට'යනුවෙන් දෙයාකාරයකින් සිදුවීම ප්‍රධාන ලක්ෂණයක් ලෙස දැක්විය හැකි ය. එනම් නාමපද සමග විභක්ති ප්‍රත්‍ය විශ්ලිෂ්ට ව යෙදෙන අතර සර්වනාම සමග විභක්ති ප්‍රත්‍ය සංශ්ලිෂ්ට ව යෙදේ. මෙලෙස විභක්ති ප්‍රත්‍ය සම්බන්ධයෙන් දක්නට ලැබෙන විවිධ විශේෂ ලක්ෂණ, හින්දී භාෂාව හදාරන සිංහල භාෂික විද්‍යාර්ථීන්ට ගැටලු උපදවන කරුණක් බවට පත් ව ඇත.

හින්දී භාෂාවේ අන්තර්ගත විභක්ති ප්‍රත්‍ය අතුරින් සිංහල භාෂික විද්‍යාර්ථීන්ට ගැටලුකාරී තත්වයන් ඇතිකරන්නා වූ විභක්ති ප්‍රත්‍ය කවරේ ද? එම ගැටලුකාරී තත්වයන් ඇතිවීමට කිනම් සාධක බලපාන්නේ ද? භාෂා ඥානය ප්‍රගුණ කිරීමෙහි ලා එම ගැටලුකාරී තත්වයන් කවර අයුරින් බලපාන්නේ ද? යන කරුණු අධ්‍යයනයට ලක්කිරීම මෙම පර්යේෂණ පත්‍රිකාවේ අරමුණ වේ.

එම ගැටලුකාරී තත්වයන් මනාව හඳුනා ගැනීමෙන් හින්දී භාෂාව හදාරන සිංහල භාෂික විද්‍යාර්ථීන්ට භාෂාව ප්‍රගුණ කිරීමට සහ නිවැරදි ව භාවිත කිරීමට  අවකාශ සැලසේ.